සකස් කිරීම : ධනුෂ්ක සෙනවිරත්න.
කෑ/මාව/ගබ්බල සිරිසඟබෝ ම.වි. (මාවනැල්ල කලාපය)


Department of Education, Sabaragamuwa Province/ Weekly School

# ඇතිල්ලීමෙන්, පෙළීමෙන්, පිඹීමෙන් හඬ නිපදවියහැකි සංගීත මෙවලම් සකසමු.

**විවිධ සංගීත භාණ්ඩවල හඬ ආසන්න වශයෙන් උපදවා ගත හැකි මෙවලම් සකස්කර ගැනීම සඳහා අපට පරිසරයෙන් සපයාගත හැකි විවිධ ද්‍රව්‍ය ගැන හඳුනා ගනිමු.**

## ක්‍රියාකාරකම

ජනේල්වල ග්‍රිල් ගැසීමට යොදාගන්නා පට්ටම් යකඩ කැබලි කිහිපයක් හෝ බුරුත,පළු,හල්මිල්ල වැනි දැවයෙන් තැනූ ලී කැබලි කිහිපයක් සොයාගන්න. මෙම පතුරු අඟල් 9 , 8 , 6 වශයෙන් කියතකින් කපාගෙන පහත දැක්වෙන රූපය ආකාරයට රාමුවක ඇන ගසා සවිකරගන්න. මෙම ආදේශක ග්ලොකන්ස්පීල් එකට තට්ටු කිරීමෙන් ඇතිවන නාදය ගැන අවධානය යොමු කරන්න.



ඉහත සවිකර ඇති දැව කුට්ටි හෝ පට්ටම් කැබලි කියතක් ආධාරයෙන් දිග අඩු වැඩි කිරීමෙන් හඬ ඉහළ පහළ යන බව අවබෝධ කරගන්න. ඔබට හැකිනම් එම පතුරුවලින් නිකුත්වන නාදයට හිමි ස්වරය හඳුනාගන්න.

## අභ්‍යාසය

**(වැරදි වචනය කපා හරින්න.)**

දැව කුට්ටි හෝ පට්ටම් කැබලිවල දිග වැඩිවූ විට හඬ | ඉහළ | පහළ | යයි.

දැව කුට්ටි හෝ පට්ටම් කැබලිවල දිග අඩුවූ විට හඬ | ඉහළ | පහළ | යයි.